*සැ. යු.-* 2024.06.07 දින පළ කරන ලද අංක 2388 ගැසට් පත්‍රයේ (IVඅ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,389 - 2024 ජූනි මස 14 වැනි සිකුරාදා - 2024.06.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1644 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1651 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජූලි මස 05 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජූනි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1641- B 82579— 5,403 (2024/06)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය ඃ**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

දෙමළ මාධ්‍ය විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**යාපනය දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2024 ජූලි මස 15** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2024 මැයි මස 23 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| යාපනය | දිවයින | දිවයින (නෙඩුන්තීවු කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය |

06-111

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

## වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් වෛද්‍ය රසායානාගාර කාර්මික විද්‍යාඥ, විකිරණ ශිල්පී, භෞත චිකිත්සක හා ශ්‍රවණවේදී කාර්මික ශිල්පී යන තනතුරුවල අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවන් සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2024

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ පහත සඳහන් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් මගින් උපාධිය ලබා ඇති පහත සඳහන් සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමට අපේක්ෂිත උපාධිධාරීන් සංඛ්‍යාව සහ සම්පූර්ණ කළයුතු සුදුසුකම් :-

| සංකේත අංකය | අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව | අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවාගැනීම සඳහා අපේක්ෂිත උපාධිධාරීන් සංඛ්‍යාව | සම්පූර්ණ කළ යුතු උපාධි සුදුසුකම |
|---|---|---|---|
| 1. | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | 154 | වෛද්‍ය රසායනාගාරවේදී (B.Sc.Medical Laboratory Science) |
| 2. | විකිරණ ශිල්පී | 200 | විකිරණ ප්‍රතිකාරවේදී (B.Sc. Radiotherapy)<br>විකිරණ විද්‍යාවේදී (B.Sc. Radiography) |
| 3. | භෞත චිකිත්සක | 94 | භෞත චිකිත්සකවේදී (Bachelor in Physiotherapy)<br>විද්‍යාවේදී භෞත චිකිත්සක (B.Sc. Physiotherapy) |
| 4. | ශ්‍රවණවේදී කාර්මික ශිල්පී | 23 | කථන හා ශ්‍රවණ විද්‍යා උපාධිය (ශ්‍රවණවේදී විශේෂ) (B.Sc. Speech and Hearing Sciences-Specializing in Audiology) |

***සටහන*** :- විදේශ විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවෙකු නම් ඉල්ලුම් කරනු ලබන එක් එක් තනතුරට අදාළ ව ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

02. *අනෙකුත් පොදු සුදුසුකම්* :-

(අ) සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා සෑම අයුරකින් ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

(ආ) තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඇ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ඈ) 2024.07.05 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(ඉ) අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය (Effective Date) අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

03. *අයදුම් කළ යුතු ක්‍රමය* :-

(අ) මේ සමග ඇති ආදර්ශ අයදුම්පතේ ආකෘතිය අනුව ස්වකීය අයදුම්පත සකස් කළ යුතු අතර ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කළ යුතුය. (අංක 1 සිට 9 දක්වා පළමු පිටුවේ ද, 10 සිට 13 දක්වා දෙවන පිටුවේ ද වන ලෙස)

(ආ) උපාධි සහතිකයේ හා GPA අගය දැක්වෙන සහතිකයේ තමා විසින් සත්‍ය බවට සහතික කළ පිටපතක් සමඟ ඉදිරිපත් කළ යුතුය.

(ඇ) අයදුම්පතේ "ලදුපත" ස්ථානයේ, ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරන "සෞඛ්‍ය ලේකම් විභාග ගාස්තු රැස්කිරීම" යන ගිණුමට රු.1,000.00 බැරකර එම ලදුපත නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපත ඇලවීමට පෙර එහි පිටපතක් ලබා ගන්න)

(ඈ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතීඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු.393,684.00 ට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කල යුතුය.

(ඉ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක බහා එම කවරයේ ඉහළ කෙළවරේ "**පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2024**" වශයෙන් හා අදාළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර **2024.07.05** දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

*සටහන* :- ඉහත 2 හා 3 යටතේ දැක්වෙන සුදුසුකම් හා අනෙකුත් සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන **2024.07.05 දිනට** සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

4. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත්, ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය. එමෙන් ම මෙය බාහිර බඳවා ගැනීමක් බවත්, අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් සිහි තබා ගත යුතුය.

5. මෙම *ගැසට්* නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන, අසම්පූර්ණ, ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති, බැංකු ලදුපත අලවා නොමැති හා **2024.07.05** දින හෝ ඊට පෙර ලියාපදිංචි කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ.

6. සෞඛ්‍ය අමාත්‍යාංශයේ අත්‍යාවශ්‍ය තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අනුමැතිය ලබාගැනීම මැයෙන් **2024.03.28** දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සටහනේ සඳහන් පරිදි සහ කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/0016/2023 හා **2023.12.15** දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇති උපාධිධාරීන් සංඛ්‍යාව මේ වනවිට උපාධිය සම්පූර්ණ කරන ලද ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලින් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. එසේම ඉහත එක් එක් පුහුණුව සඳහා නියමිත දිනට පෙර සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතට ලැබෙන අයදුම්පත් ඉහතින් දක්වා ඇති උපාධිධාරීන්ගේ උපාධිය බලපවත්වන දිනය (Effective Date) හා උපාධියේ ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) පදනම් කරගෙන කුසලතා ලේඛන සකස් කර එක් එක් පුහුණු පාඨමාලාවන්ට බඳවා ගනු ලබන සංඛ්‍යාව පදනම් කරගනිමින් සුදුසුකම් ලබන අපේක්ෂකයින් තෝරාගනු ලැබේ.

7. (අ) සේවා අවශ්‍යතාවය අනුව පුහුණුවට බඳවාගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව පිළිබඳව සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

(ආ) අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවා ගැනීමේ දී යම් ගැටළුකාරී තත්ත්වයක් මතු වුවහොත් එවැනි අවස්ථාවක දී වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ 7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය හි සටහන යටතේ ලබා දී ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් හා එහි සහතික කරන ලද පිටපත බැගින් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය
(2) උපාධි සහතිකයේ මුල් පිටපත (සහතික කළ පිටපතක් අයදුම්පත සමඟද අමුණා එවිය යුතුය)
(3) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකයේ මුල් පිටපත
(4) ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය
(5) පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතික (ග්‍රාම නිලධාරී සහතිකය)

8. පුහුණු කිරීමේ පරිපාටිය :-

(අ) සම්මුඛ පරීක්ෂණයට ලක් කරනු ලබන අයදුම්කරුවන් අතරින් තෝරාගත් උපාධිධාරී අයදුම්කරුවන්/අයදුම්කාරියන් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට මාස 06 කාලයක් සඳහා දිවයින පුරා රෝහල් හා සෞඛ්‍ය ආයතන වෙත අනුයුක්ත කරනු ලැබේ.

(ආ) එලෙස රෝහල් හා සෞඛ්‍ය ආයතන වෙත අනුයුක්ත කරනු ලබන අභ්‍යාසලාභීන් අදාළ රෝහල් හා සෞඛ්‍ය ආයතනවල බල පැවැත්වෙන නීති රීතිවලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝග වලට ද යටත් වනු ඇත.

(ඇ) පුහුණුව ලබන කාලපරිච්ඡේදය අවසානයේ දී පුහුණුව සාර්ථකව නිම නොකරන, වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් අනුයුක්ත කරනු ලබන රෝහලේ හෝ සෞඛ්‍ය ආයතනයේ පවතින කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

(ඈ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුල දී අභ්‍යාසලාභීන්ට සෞඛ්‍ය ලේකම්ගේ අත්සනින් නිකුත් කරන ලද පොදු චක්‍රලේඛ අංක 01-32/2017 හා 2017.06.07 දිනැති ලිපියේ විධිවිධාන අනුව දීමනා ගෙවනු ලැබේ.

(ඉ) පුහුණුවට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්,එකී පුහුණුව සම්පූර්ණයෙන් ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වර්ෂ පහක (05) කාලපරිච්ඡේදයක් රේඛීය අමාත්‍යාංශයට හෝ පළාත් සභාවට අයත් පත්කළ රෝහලේ ස්වකීය තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ විෂයභාර ලේකම් හෝ ඔහු/ඇය විසින් බලය පවරනු ලබන නිලධරයෙකු සමඟ ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. එම ගිවිසුම හා ඇපකරය පුහුණුවට ලියාපදිංචිය ලබන දිනයේ ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ අංශය වෙත ලැබීමට සැලැස්විය යුතු අතර පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැරගියහොත් හෝ ඉහත 9 (ඇ)වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ (05) කාලපරිච්ඡේදයක් අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ පුහුණු කාලය තුළ දි ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන වියහියදම් ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහු/ඇය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ගෙවිය යුතුය. එසේ නොමැති වුවහොත් එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

9. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :-

වෛද්‍ය රසායානාගාර කාර්මික විද්‍යාඥ, විකිරණ ශිල්පී, භෞත චිකිත්සක හා ශ්‍රවණවේදී කාර්මික ශිල්පී යන තනතුරුවල අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ පමණින් අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය බැඳී නොසිටින අතර එක් එක් තනතුරුවල ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම සිදුකරන/නොකරන බව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්වය. ඒ අනුව අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් අපේක්ෂක/අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පුරප්පාඩු මත අදාළ තනතුරේ III වැනි පන්තියේ තනතුරට පත් කිරීමට කටයුතු කෙරේ. එසේම උක්ත 1 ඡේදයේ සඳහන් වන පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MT-6-2016 හි පරිදි රු.32,080-445x10-660x11-730x10-750x10-රු.58,590 යන වැටුප් පරිමාණය හිමිවන අතර ගෙවීම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන අනුව සිදු කරනු ලැබේ.

10. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුලත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම ලැබීමෙන් පසු ඉහත සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කරනු ලබන අතර ඔහුට හෝ ඇයට ලබා දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/තනතුරින් පහකර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. තවද පුහුණු කාලය තුල දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන වියහියදම් හි ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

11. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවීමේ පළමු මාසය ඇතුලත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

12. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා රජයේ නිලධාරීන්ට අදාළ වන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

13. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටියි.

14. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටලු සහගත තත්ත්වයක් උදා වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

වෛද්‍ය පී. ජී. මහීපාල,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2024 ජුනි මස 13 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

### ආදර්ශ අයදුම්පත

| පුහුණු පාඨමාලාවන්ට අදාල සංකේත අංකය (ගැසට් නිවේදනයට අනුව) |
|---|
| |

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් වෛද්‍ය රසායානාගාර කාර්මික විද්‍යාඥ, විකිරණ ශිල්පී, භෞත චිකිත්සක හා ශ්‍රවණවේදී කාර්මික ශිල්පී යන තනතුරුවල අනුස්ථාන හා සමායෝජන පාඨමාලාවන් සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2024
(අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලන්න)

අයදුම්කරන පාඨමාලාව (සිංහලෙන්/දෙමළෙන්) :————.

අයදුම්කරන පාඨමාලාව (ඉංග්‍රීසියෙන්) :————.

1. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම :————.
(ඉංග්‍රීසියෙන් කැපිටල් අකුරෙන්) උදා. A. B. C. SILVA
(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය :————. (ඡායා පිටපතක් අමුණන්න)

| 3. | තැපැල් ලිපිනය :- | සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|---|---|
| | | ................................ | ................................ |
| | | ................................ | ................................ |
| | | ................................ | ................................ |
| | | ................................ | ................................ |
| 4. | (අ) ස්ථිර ලිපිනය :- | සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
| | | ................................ | ................................ |
| | | ................................ | ................................ |
| | | ................................ | ................................ |
| | | ................................ | ................................ |

(ආ) දුරකථන අංකය :- ජංගම

ස්ථිර

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය :- සිංහලෙන්/දෙමළෙන් :————. ඉංග්‍රීසියෙන් :————.

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක්ද? ඔව්/නැත :————.

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන් ද? :————.

5. උපන් දිනය :- වර්ෂය :————. මාසය :————. දිනය :————.

2024.07.05 දිනට වයස අවුරුදු :————. මාස :————. දින :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :- ස්ත්‍රී ☐ පුරුෂ ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.

7. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග ඃ ඔව් ☐ නැත ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

8. විවාහක/අවිවාහක බව :- විවාහක ☐ අවිවාහක ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

9. අධ්‍යාපන සුදුසුකම් :-

| අනු අංකය | සමත් වූ උපාධිය | සාමාර්ථය | ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) හා උපාධිය බල පවත්වන දිනය | විශ්වවිද්‍යාලය | අධ්‍යයන වර්ෂය | ලිඛිත විභාග යට පෙනී සිටින භාෂා මාධ්‍ය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද? ඔව් ☐ නැත ☐
(අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න.)

"ඔව්" නම් විස්තර සපයන්න :————.

11. අයදුම්කරුගේ සහතිකය :-

(අ) මා විසින් *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් පූර්ණකාලීන පාඨමාලාවට සහභාගී නොවන බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සෙකු වන බවත් පත්වීම් ලදහොත් ඉන් අනතුරුව හෝ එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බව ද මම දැන සිටිමි.

| |
|---|
| ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය ලේකම් විභාග ගාස්තු රැස්කිරීම යන ගිණුමට අදාල මුදල් ගෙවා එම ලදුපතෙහි මුල් පිටපත මෙම ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. |

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය .................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

දිනය :————.

සහතික කරන නිලධරයාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

13. ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නොවන වචන කපා හරින්න.)

(i) ඉහත අයදුම්කරු/අයදුම්කාරිය වන .................. මහතා/මහත්මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ .................. තනතුර දරන බව මින් සහතික කරමි.

(ii) ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, ඔහු/ඇය තනතුර සඳහා තෝරා ගත හොත්, ඔහු/ඇය දරන තනතුරට නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව.

06-148

---

## ජාතික පොලිස් කොමිෂන් සභාව

### සාමාජිකයකු පත්කිරීම

ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයක ඇති වී තිබෙන පුරප්පාඩුව පිරවීම සඳහා මේ පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති පරිදි යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු නම් එවැනි තැනැත්තකු ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්වීම සඳහා සුදුසුකම් නොලබයි. තව ද, කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට පෙරාතුව රජයේ නිලධරයකු හෝ අධිකරණ නිලධාරියකු හෝ වශයෙන් රජයේ සේවයේ නිරතව සිටි සෑම තැනැත්තකු ම එකී පත්කිරීම බලාත්මක වූ විට තමා දරමින් සිටි ධුරය අතහැරිය යුතු අතර රජයේ නිලධරයකු හෝ අධිකරණ නිලධාරියකු හෝ වශයෙන් තවදුරටත් පත් කරනු ලැබීමට ඔහු/ ඇය නුසුදුස්සකු වන්නේ ය.

අයදුම්පත්‍ර, පාර්ලිමේන්තු වෙබ් අඩවියෙහි (www.parliament.lk) ක්ෂණික සබැඳි යටතේ ''ජාතික පොලිස් කොමිෂන් සභාව සඳහා සාමාජිකයකු පත්කිරීම'' නමින් පළකර ඇති ආකෘතිය අනුව පිළියෙල කළ යුතු අතර, යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2024 ජූලි මස 01 දින හෝ එදිනට පෙර,**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම්
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා කාර්යාලය
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ constitutionalcouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ/ විද්‍යුත් ලිපියෙහි විෂය වශයෙන් ''ජාතික පොලිස් කොමිෂන් සභාව සඳහා සාමාජිකයකු පත්කිරීම'' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

2024 ජුනි මස 14 වැනි දින.

06-170

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය

(2022 අංක 105 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත.)

ව්‍යාපාර ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
Certificate in Business English - 2024

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය විසින් ව්‍යාපාර ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව (Certificate Course in Business English) සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා මුහුණ දුන් ශිෂ්‍යයන්, උසස් පෙළ ශිෂ්‍යයින්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියා නියුතු පිරිස්, විදේශගත වී සිටින හෝ විදේශගත වීමට බලාපොරොත්තුවෙන් සිටින පිරිස් සහ ඉංග්‍රීසි භාෂාව කෙටිකාලයක් තුළ ප්‍රායෝගිකව ඉගෙන ගැනීමට උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට අයදුම්පත්‍ර කැඳවා ඇත.

| | |
|---|---|
| සුදුසුකම් : | අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත්වීම. |
| පාඨමාලාවේ ස්වභාවය : | මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය) |
| ඉගැන්වීම් ක්‍රමවේදය : | **Zoom** තාක්ෂණය හරහා සජීවී දේශන ඉගැන්වීම් සිදුකිරීම සහ පහසු දිනයන් තුළ දී නැරඹිය හැකි පටිගත කරන ලද දේශන සහ නිබන්ධන LMS පද්ධතිය හරහා ලබාදීම සිදුකෙරේ. |
| මාධ්‍ය : | ඉංග්‍රීසි |
| පාඨමාලා කාලය : | මාස 04 කි. |
| පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු : | සම්පූර්ණ පාඨමාලාව සඳහා අයකිරීම රු. 10,000.00 කි. පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1000.00ක මුදලක් ලියාපදිංචි ගාස්තුව වශයෙන් ගෙවිය යුතුය. රු 10,000.00 ක මුදල එකවර හෝ වාරික 04කින් ගෙවා අවසන් කළ හැකි ය. |

**පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය :**

අයදුම්කරුවන් විසින්,

1. තම අනන්‍යතාවය තහවුරු කළ හැකි ලේඛනගත ඡායාරූප (ජාතික හැඳුනුම්පත/රියදුරු බලපත්‍රය/ගුවන් ගමන් බලපත්‍රය)
2. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල ලේඛනයේ සහ වෙනත් අධ්‍යාපනික සහතිකවල ඡායාපිටපත්,
3. තමාගේ වර්ණවත් පැහැදිලි ඡායාරූපයක්,

**074 - 043 7777 (WhatsApp)** අංකයට යොමු කළ යුතු ය.

**ශිෂ්‍යයින් බඳවාගන්නා අවසාන දිනය : 2024.07.10 වේ.**

*වැඩි විස්තර සඳහා :* කාර්යාල වේලාවන් වන පෙ.ව. **8.30** සිට ප.ව. **4.30** දක්වා, 081 317 1155 දුරකථන අංකය හරහා විමසිය හැකිය.

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

06-106

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ විවෘත තරග විභාගය -2024

## Open competitive Examination for the enrollment of students for the National Diploma in Agricultural Production Technology in Sri Lanka Schools of Agriculture - 2024

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාල-යන්හි පැවැත්වෙන "කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5)" හැදෑරීම සඳහා 2025/2026 අධ්‍යයන වර්ෂයට අදාළ ව සිසුන් ඇතුලත් කර ගැනීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය විසින් **2024 ඔක්තෝබර් මාසය** තුළ දී **සිංහල හා දෙමළ** මාධ්‍යයවලින් ප්‍රධාන නගර කිහිපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පැවැත්වීමට අපේක්ෂිත ය.

**02. කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව**

2.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇති පාඨමාලාවක් වන අතර ඒ සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටම (NVQ level 5) ලබාදේ.

2.2 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් අනුරාධපුර, බිබිල, ලබුදුව, පාලමුණේ, පරන්තන් හා වාරියපොල යන කෘෂිකර්ම විද්‍යාලයන් තුළ කාන්තා සහ පිරිමි දෙපාර්ශවයට ම විවෘත පාඨමාලාවක් ලෙසින් මෙම පාඨමාලාව පවත්වා ගෙන යනු ලැබේ.

2.3 පාඨමාලා කාලය වසර 1½ කි. එයින් වසරක කාලයක් කෘෂිකර්ම විද්‍යාලයක් තුළ දී නිශ්චිත විෂය මාලාවකට අනුකූලව පුහුණුව ලබාදේ. අනතුරුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ (NAITA) අධීක්ෂණය යටතේ මාස 06ක රැකියාස්ථ පුහුණුවක් නම් කරන ලද ආයතනයකින් ලබාගත යුතුවේ.

2.4 පූර්ණකාලීන නේවාසික පාඨමාලාවක් වන මෙම පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

2.5 ඇතුළත්කර ගැනීමේ තරග විභාගයේ ප්‍රතිඵල මත පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලැබූවන්ගේ සුදුසුකම්වල නිරවද්‍යතාවය සම්මුඛ පරීක්ෂණයක් තුළින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුලත්කර ගැනීම සඳහා තෝරාගනු ලැබේ.

2.6 පාඨමාලාව සඳහා අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් මත හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 4 (NVQ Level 4) මට්ටමේ පාඨමාලාවක් හදාරා ලබා ගත් සුදුසුකම් මත ඉල්ලුම් කල හැකිය.

**03. පාඨමාලාවට ඇතුළත්වීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් :**

3.1 අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් මත අයදුම්කරන අයදුම්-කරුවන් සඳහා :

3.1.1 අධ්‍යාපන සුදුසුකම් :

දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සහිතව විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබිය යුතු අතර භාෂාව සහ තවත් ඕනෑම විෂයයන් 02ක් සඳහා සම්මාන සාමාර්ථ හෝ ඊට ඉහල සාමාර්ථ ලබා තිබිය යුතුය.

ඉහත වාර දෙක තුළ දී හෝ වෙනත් ඕනෑම වාර ගණනකට මුහුණ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබිය යුතුය.

*සහ*

අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක්වත් සමත් වී තිබීම.

*හෝ*

අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී තාක්ෂණවේදය විෂය ධාරාව තුළ ජෛව පද්ධති තාක්ෂණවේදය/ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විෂයයන් හදාරා අවම වශයෙන් එක් විෂයයක්වත් සමත් වී තිබීම.

*වැදගත්:-* **ජීව විද්‍යාව සහ තාක්ෂණවේදය විෂය ධාරාවන් යටතේ අ.පො.ස. (උ.පෙළ) සඳහා උක්ත විෂයය සංකලනවලට අදාළ විෂයයන් තුනෙන් බැහැර වෙනත් විෂයයන් හදාරා තිබීම නුසුදුසුකමක් ලෙස සැලකේ.**

3.1.2 වයස :

**2024.07.14** දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 25 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව අයදුම්කරුගේ උපන් දිනය 2006.07.14 දින හෝ ඊට පෙර හා 1999.07.14 දින හෝ ඊට පසුව විය යුතුය.)

3.2. කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 4 මට්ටමේ (NVQ Level 4) පාඨමාලාවක් හදාරා සහතිකපතක් හිමි අයදුම්කරුවන් සඳහා

3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සහිතව විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබිය යුතු අතර භාෂාව සහ තවත් ඕනෑම විෂයයන් 02ක් සඳහා සම්මාන සාමාර්ථ හෝ ඊට ඉහල සාමාර්ථ ලබා තිබිය යුතුය.

ඉහත වාර දෙක තුළදී හෝ වෙනත් ඕනෑම වාර ගණනකට මුහුණ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබිය යුතු වේ.

*සහ*

අයදුම්පත් කැඳවන අවසාන දිනට කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ පහත සඳහන් කුමන හෝ පාඨමාලාවක් හදාරා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම මගින් ලබා දෙන ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) සහතික ලාභියෙකු වීම.

- පැල තවාන් සංවර්ධන සහායක
- ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)
- උද්‍යාන අලංකරණ ශිල්පී
- භූ දර්ශන සංවර්ධන සහායක

*හෝ*

කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ වෙනත් පාඨමාලාවක්

3.2.2 වයස :

**2024.07.14** දිනට මෙම අයදුම්කරුගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව අයදුම්කරුගේ උපන් දිනය 2006.07.14 දින හෝ ඊට පෙර හා 1989.07.14 දින හෝ ඊට පසුව විය යුතුය.)

3.3 මෙම පාඨමාලාව තුළ කෘෂිකාර්මික කටයුතු වලට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් හෙයින් පාඨමාලාව හැදෑරීම සඳහා ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයක් පැවතිය යුතුය. පාඨමාලාවට ඇතුල්වන අවස්ථාවේ දී ගර්භණීභාවයේ පසුවීම පාඨමාලාවට ඇතුළත් කර නොගැනීමටත්, පාඨමාලාවට ඇතුළත් වීමෙන් අනතුරුව ගර්භණී තත්වයට පත්වීම පාඨමාලාවෙන් ඉවත් කිරීමටත් හේතුවක් වනු ඇත.

(පාඨමාලාව හැදෑරීම සඳහා ඔබ තෝරාගතහොත් ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බවට රජයේ වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)

3.4 පූජ්‍ය පක්ෂය මෙම පාඨමාලාව හැදෑරීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

3.5 රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

04. **විභාගය පැවැත්වෙන මාධ්‍යය සහ විභාග මධ්‍යස්ථාන :**

4.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කරගැනීමේ තරග විභාගය **සිංහල හා දෙමළ මාධ්‍යය** වලින් පමණක් පවත්වනු ලබන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4.2 තරග විභාගය පහත සඳහන් නගර ආශ්‍රිත ව පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී 2024 ඔක්තෝබර් මාසය තුළ දී පවත්වනු ලැබේ. අයදුම්පත පිරවීමේ දී තමා විභාගයට පෙනී සිටීමට කැමති නගරය සහ ඊට අදාළ අංකය ඇතුළත් කළ යුතුය. එම තෝරාගැනීම පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *නගර අංකය* | *නගරය* |
|---|---|
| 1. | අම්පාර |
| 2. | අනුරාධපුරය |
| 3. | දඹුල්ල |
| 4. | ගම්පහ |
| 5. | ගාල්ල |
| 6. | හම්බන්තොට |
| 7. | මහනුවර |
| 8. | කුරුණෑගල |
| 9. | වව්නියාව |

4.3 විභාග මධ්‍යස්ථාන සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම්කර නොමැතිවිට හෝ වෙනත් ප්‍රායෝගික අපහසුතාවයන් ඇති වූ විට අයදුම්කරුවන් විසින් ඉල්ලුම්කර ඇති විභාග මධ්‍යස්ථානය වෙනුවට වෙනත් මධ්‍යස්ථානයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ඇත.

5. **පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම :**

5.1 මෙම තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවීම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ සිදු කරනු ලැබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ www.doa.gov.lk යන වෙබ් අඩවිය හරහා මේ සඳහා අයදුම් කල යුතුය.

5.2 විභාග ගාස්තුව **රු.1300.00කි.** මහජන බැංකුවේ පේරාදෙණිය ශාඛාවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 057100179027204 දරන ගිණුමට විභාග ගාස්තු බැර කර අයදුම්කරුගේ නමින් ලදුපතක් ලබා ගත යුතුය. එම මුදල් කුවිතාන්සිය නිකුත් කල දිනය, ශාඛාව හා අංකය අයදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කල යුතුය.

5.3 අයදුම්පත ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සම්පූර්ණ කල යුතුවේ. අයදුම්පත සම්බන්ධයෙන් යම් ගැටළුවක් වෙතොත් අදාළ තොරතුරු සමගින් 0812 388 340 හෝ 0812 388 341 යන දුරකතන අංක වලින් විමසීමක් කල හැකිය.

5.4 විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් ද සිදු නොකෙරේ.

5.5 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන **2024.07.14 රාත්‍රී 12.00** න් පසුව අයදුම්පත වෙබ් අඩවියෙන් ඉවත් කරනු ලැබේ.

5.6 මාර්ගගත ආකාරයෙන් සම්පූර්ණ කල අයදුම්පතේ දෘඪ පිටපතක් ලබාගැනීම අනිවාර්යය වේ.

5.7 එසේ ලබාගත් දෘඪ පිටපතෙහි අයදුම්කරුගේ අත්සන යොදා පහත සඳහන් ඇමුණුම් සහිතව ලියාපදිංචි තැපෑලෙන් පමණක් **2024.07.19** වැනි දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු), ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ - 5)" යන්න සඳහන් කළ යුතුය.

ඇමුණුම් :

අ. අ.පො.ස (උසස් පෙළ) සුදුසුකම් මත අයදුම් කරන අයදුම්කරුවන් සඳහා

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල ලේඛනවල ඡායා පිටපත්
(ii) අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපත
(iii) උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්
(iv) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්
(v) මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත

ආ. ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) පාඨමාලාවක් හදාරා අයදුම්පත් කැඳවන අවසාන දිනට සහතිකපතක් හිමි අයදුම්කරුවන් සඳහා

(i) අ.පො.ස. (සා.පෙ) විභාගයේ ප්‍රතිඵල ලේඛනවල ඡායා පිටපත්
(ii) ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ 4) සහතිකය
(iii) උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්
(iv) ජාතික හැඳුනුම්පතෙ හි ඡායා පිටපතක්
(v) මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත

නියමිත දිනට ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාදවන හෝ නැති වන හෝ අයදුම්පත් පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

5.8 5.7 හි සඳහන් ඇමුණුම් සහිත අයදුම්පතෙහි මුද්‍රිත පිටපත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති වීම විභාගය සඳහා පෙනී සිටීමට නුසුදුසුකමක් වේ. එබැවින් නියමිත දිනට හෝ ඊට පෙර එම ලේඛන එවීමට වග බලා ගත යුතු වේ. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පතේ සහ විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපත් තමා සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

06. **අනන්‍යතාවය සනාථ කිරීම :**

6.1 විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුල දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථකල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් ඉදිරිපත්කල යුතුවේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය

07. **විභාග ක්‍රමය :**

7.1 තරග විභාගය සඳහා කෘෂිකර්මය සහ බුද්ධි පරීක්ෂණය ලෙස පැය 01 බැගින් වූ විෂයයන් දෙකක් ඇතුළත්ය. සෑම විෂයයක් සඳහා ම ලකුණු 100 බැගින් ලබා දී අවසන් ලකුණු ප්‍රමාණය මුළු ලකුණු 200න් කොපමණද වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ.

7.2 එක් එක් විෂයය සමත් වීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය 30%ක් වේ.

7.3 විෂයය නිර්දේශය :

කෘෂිකර්මය : අ.පො.ස. (සා.පෙළ) කෘෂිකර්ම විෂයය නිර්දේශ මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ යාවත්කාලීන

විෂය කරුණු ආශ්‍රිතව සකස් කරන ලද බහුවරණ මාදිලියේ ප්‍රශ්න අඩංගු වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

බුද්ධි පරීක්ෂණය : රටා, සබඳතා, පුරෝකථන, ගැළපීම්, විශ්ලේෂණ, කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්ෂාවට ලක්වේ. බහුවරණ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු වේ.

7.4 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා, ඊට අදාළ ලදුපත ඇතුළුව 5.7 හි සඳහන් අනෙකුත් ඇමුණුම් සහිත ව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. ඒ බව කෙටි පණිවිඩයක් මඟින් ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය විසින් දැනුම් දෙනු ඇත.

විභාග ප්‍රවේශ පත්‍රය සම්බන්ධ යම් ගැටළුවක් වෙතොත් අදාළ තොරතුරු සමගින් 081 2388085 හෝ 081 2388059 යන දුරකථන අංකවලින් විමසීමක් කළ හැකිය.

7.5 අයදුම්පතේ සඳහන් කර ඇති අයදුම්කරු සම්බන්ධ කර ගැනීමේ මාර්ගවන විද්‍යුත් තැපැල් ලිපිනය, Whatsapp අංකය හා දුරකථන අංක බඳවා ගැනීමේ කටයුතු අවසන් වනතුරු නොවෙනස්ව පවත්වා ගත යුතුය. එම අංක වෙනස් කිරීම හේතුවෙන් ඇතිවන අපහසුතාවයන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

7.6 විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, මාණ්ඩලික සේවයේ නිලධාරියෙකු, ත්‍රිවිධ හමුදා අධිකාරියලත් නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කර ගත යුතුය.

7.7 විභාගය සඳහා පෙනී සිටින පළමු අවස්ථාවේදී ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

7.8 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට අපේක්ෂකයන් හට සිදුවේ.

7.9 තරග විභාගයේ දී සිසුන් ලබාගත් ලකුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කරනු ලැබේ. එම ලකුණු පාදක කර ගනිමින් සහ බඳවාගනු ලබන සංඛ්‍යාව පිළිබඳව සැළකිලිමත් වෙමින් වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහි දී අධ්‍යාපනික හා අදාළ අනිකුත් සහතික පරීක්ෂා කිරීම සිදුකරන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් කර ගැනීමට අපේක්ෂිත සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

7.10 ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම මත හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදාළ අයදුම්කරුවන්ගේ සුදුසුකම් පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන් පසුව හෝ යන කවර අවස්ථාවක දී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යැයි තීරණය වන අයදුම්කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7.11 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකට ම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අයදුම්කරුවන්ට කිසිඳු දීමනාවක් ගෙවනු නොලැබේ.

08. බඳවා ගැනීමේ ක්‍රමවේදය :

8.1 පාඨමාලාව සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 90% ක ප්‍රමාණයක් අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් මත බඳවා ගැනීමට කටයුතු කරන අතර, ඉතිරි 10% ක ප්‍රමාණය ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් බඳවා ගනු ලැබේ.

8.2 අදාළ වර්ෂයේ දී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කරගනු ලබන පිරිමි හා කාන්තා සිසුන් සංඛ්‍යාව තීරණය කරනුයේ එම විද්‍යාලවල පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල ඇති ධාරිතාවය සහ එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් පාදක කර ගනිමිනි. එබැවින් තෝරා ගැනීමට සලකා බලන තරග විභාගයේ කඩඉම් ලකුණු මට්ටම් පිරිමි හා කාන්තා අයදුම්කරුවන් අතර වෙනස් විය හැක.

8.3 යම් අයදුම්කරුවෙක් පාඨමාලාවට බඳවා ගැනීම සඳහා කරනු ලබන අනියම්/අයුතු බලපෑම් ඔහු/ඇය පාඨමාලාවට ඇතුළත් කර ගැනීම සඳහා නුසුදුස්සෙක් වීමට හේතුවේ.

8.4 පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කෘෂිකර්ම විද්‍යාලයන්ට අනුයුක්ත

කිරීමෙන් පසු ඔවුන්ට කෘෂිකර්ම විද්‍යාල අතර මාරු වීම් සිදු කළ නොහැක.

8.5 පූර්ණකාලීන නේවාසික පාඨමාලාවක් වන මෙම පාඨමාලාවට ලියාපදිංචි වීමෙන් පසු පාඨමාලාව හැර යන්නේ නම් නැවත පාඨමාලාව හැදෑරීම සඳහා කිසිදු අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

8.6 බඳවා ගැනීමට අදාළ කරුණු සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

8.7 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක්, අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

කේ. එන්. එස්. රණතුංග,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2024 ජූනි මස 05 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

06-100

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ශ්‍රී ලංකා කොරියා ජාතික වෘත්තීය පුහුණු ආයතනයෙහි, පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් බඳවා ගැනීම**

බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ ක්‍රියාත්මකවන ශ්‍රී ලංකා කොරියා ජාතික වෘත්තීය පුහුණු ආයතනයට 2024 දෙවන අර්ධ වර්ෂය සඳහා නව ආධුනිකයින් දැන් බඳවා ගැනේ.

පාඨමාලා ආරම්භය : 2024 ජූලි - අගෝස්තු
අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය : 2024 ජූලි 15
දුරකථන අංක : 011 2072850
071 0318720, 0779078190, 0715145255, 0701256211
විද්‍යුත් ලිපිනය : koreantech@vtasl.gov.lk
අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය : සහකාර අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා කොරියා ජාතික වෘත්තීය පුහුණු ආයතනය
බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය.

**පූර්ණ කාලීන පාඨමාලා**

| *අනු. අංකය* | *පාඨමාලාව* | *පූර්ණකාලීන පුහුණු කාලය (කර්මාන්තගත පුහුණු කාලය සමග)* |
|---|---|---|
| 01 | National Diploma in Automobile Technology<br>(මෝටර් රථ තාක්ෂණ ජාතික ඩිප්ලෝමාව -NVQ V) | 24 Months<br>මාස 24 |
| 02 | National Diploma in CNC Manufacturing Technology<br>(නිෂ්පාදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමාව - CNC -NVQ V) | 24 Months<br>මාස 24 |
| 03 | National Diploma in Electrical Technology<br>(විදුලි තාක්ෂණය ජාතික ඩිප්ලෝමාව -NVQ V) | 24 Months<br>මාස 24 |
| 04 | National Diploma in Fluid Power Technology<br>(තරල බල තාක්ෂණය ජාතික ඩිප්ලෝමාව - NVQ V) | 24 Months<br>මාස 24 |
| 05 | National Diploma in Mechatronic Technology<br>(මෙකාට්‍රොනික් තාක්ෂණය ජාතික ඩිප්ලෝමාව -NVQ V) | 24 Months<br>මාස 24 |

| *අනු. අංකය* | *පාඨමාලාව* | *පූර්ණකාලීන පුහුණු කාලය (කර්මාන්තගත පුහුණු කාලය සමග)* |
|---|---|---|
| 06 | National Diploma in Welding Technology<br>(පැස්සුම් තාක්ෂණය ජාතික ඩිප්ලෝමාව -NVQ V) | 24 Months<br>මාස 24 |
| 07 | National Diploma in Refrigeration & Air-conditioning Technology (ශීතකරණ සහ වායු සමීකරණ තාක්ෂණය ජාතික ඩිප්ලෝමාව -NVQ V) | 24 Months<br>මාස 24 |
| 08 | Automation & Robotics Technology (NVQ 6)<br>(ස්වයංක්‍රියකරණය සහ රොබෝ තාක්ෂණය | 36 Months<br>මාස 36 |
| 09 | Electronic Technology - (NVQ 6)<br>ඉලෙක්ට්‍රොනික තාක්ෂණය | 36 Months<br>මාස 36 |
| 10 | National Certificate in Automobile Painter<br>මෝටර් රථ පින්තාරු කිරීමේ ජාතික සහතිකය (NVQ IV) | 12 Months<br>මාස 12 |
| 11 | National Certificate in Baker බේකර් ජාතික සහතිකය - (NVQ IV) | 12 Months<br>මාස 12 |
| 12 | Quick Service Restaurant (QSR) - (NVQ (IV) | 04 Months මාස 04 |

පූර්ණකාලීන පාඨමාලා සඳහා බඳවා ගැනීම විවෘත තරග විභාගයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

සියලුම පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආපසු නොගෙවන රුපියල් 500/- ක මුදලක් විභාග ගාස්තු ලෙස ගෙවා එහි රිසිට් පත ආදර්ශ අයදුම්පත සමග එවිය යුතුයි.

පාඨමාලා ගාස්තු - සියලු පාඨමාලා සඳහා අයකෙරේ (කොන්දේසි සහිතයි)

විභාග ගාස්තු ගෙවිය යුතු තොරතුරු පහත පරිදි වේ.

Account name - Vocational Training Authority of Sri Lanka
Account No. - 071100140004520
Bank/Branch - People's Bank, Dematagoda

අර්ධකාලීන පාඨමාලා : (සති අන්ත/සන්ධ්‍යාකාලීන)

| *අනු. අංකය* | *Course/පාඨමාලාව* | *NVQ/Non* | *Duration* |
|---|---|---|---|
| 01 | National Diploma in CNC Manufacturing Technology<br>(නිෂ්පාදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමාව -CNC) | NVQ V | 16 Months<br>මාස 16 |
| 02 | National Diploma in Electrical Technology<br>(විදුලි තාක්‍ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව) | NVQ V | 16 Months<br>මාස 16 |
| 03 | National Diploma in Mechatronic Technology<br>(මෙකාට්‍රොනික් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව) | NVQ V | 16 Months<br>මාස 16 |
| 04 | National Diploma in Refrigerator & Air-condition Technology<br>(ශීතකරණ සහ වායු සමීකරණ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව) | NVQ V | 16 Months<br>මාස 16 |
| 05 | National Diploma in Automobile Technology<br>(මෝටර් රථ තාක්‍ෂණ ජාතික ඩිප්ලෝමාව) | NVQ V | 16 Months<br>මාස 16 |
| 06 | National Diploma in Welding Technology<br>(පැස්සුම් තාක්ෂණය ජාතික ඩිප්ලෝමාව) | NVQ V | 16 Months<br>මාස 16 |

| අනු. අංකය | Course/පාඨමාලාව | NVQ/Non | Duration |
|---|---|---|---|
| 07 | National certificate in Electrician<br>විදුලි කාර්මික ශිල්පී පිළිබඳ ජාතික සහතිකය | NVQ IV | 800 hrs. |
| 08 | National Certificate in Machinist (CNC Milling & Lathe)<br>යන්ත්‍ර ශිල්පී ජාතික සහතිකය (CNC Milling & Lathe) | NVQ IV | 760 hrs. |
| 09 | National Certificate in Welding<br>පැස්සුම් ශිල්පය පිළිබඳ ජාතික සහතිකය | NVQ IV | 800 hrs. |
| 10 | National Certificate in ICT Technician<br>තොරතුරු තාක්ෂණ ශිල්පී ජාතික සහතිකය | NVQ IV | 350 hrs. |
| 11 | National Certificate in Welding Technology - FCAW<br>(පැස්සුම් තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය) | NVQ III | 450 hrs. |
| 12 | Basic of Pneumatics and Hydraulics<br>වායු විද්‍යාව සහ හයිඩ්‍රොලික්ස් මූලිකාංග | Non | 150 hrs. |
| 13 | Computer Aided Drafting and Design 2D - CAD using Auto CAD<br>Auto CAD භාවිතයෙන් පරිගණක ආධාරක කෙටුම්පත් කිරීම සහ 2D - CAD නිර්මාණය කිරීම | Non | 80 hrs. |
| 14 | Computer Aided Drafting and Design 3D - CAD using Auto CAD<br>Auto CAD භාවිතයෙන් පරිගණක ආධාරක කෙටුම්පත් කිරීම සහ 3D - CAD නිර්මාණය කිරීම | Non | 80 hrs. |
| 15 | Certificate in Single Phase Electrical Installation<br>එකලා විදුලි පරිපථ ස්ථාපනය | Non | 100 hrs. |
| 16 | Certificate in TIG welding | Non | 100 hrs. |
| 17 | Certificate in Solid Work Essentials | Non | 100 hrs. |
| 18 | Certificate in Programmable Logic Control (PLC) Programming | Non | 70 hrs. |
| 19 | Certificate in Refrigeration & Air Conditioning | Non | 120 hrs. |
| 20 | FCAW Welding | Non | 100 hrs. |
| 21 | National Certificate in Draft Person | NVQ IV | 800 hrs. |
| 22 | Care Giver | NVQ III | 300 hrs. |
| 23 | Japanese Language | Non | 200 hrs. |
| 24 | Automobile Painter | Non | 100 hrs. |
| 25 | Korean Language | Non | 150 hrs. |
| 26 | Bread & Bun | Non | 278 hrs. |
| 27 | Certificate in Three phase Electrical Installation | Non | 150 hrs. |
| 28 | National Certificate in Mechatronic Technology<br>(මෙකාට්‍රොනික් තාක්‍ෂණය පිළිබඳ සහතිකය) | NVQ IV | 760 hrs. |

පාඨමාලා සහ ඇතුලත්වීමේ සුදුසුකම් :
**Course & Entry Qualification**

**Automation and Robotics Technology - (NVQ 6)**

**Electronic Technology - (NVQ 6)**

**Automobile Technology - (NVQ 5)**

**National Diploma in CNC Technology - NVQ V**

**National Diploma in Electrical Technology - NVQ V**

**National Diploma in Fluid Power Technology - NVQ V**

**National Diploma in Mechatronic Technology - NVQ V**

**National Diploma in Welding Technology - NVQ V**

**National Diploma in Refrigerator & Air-Condition Technology - NVQ V**

**3 passes for G. C. E. (A/L) Mathematics/Engineering Technology with O/L English ;**
*or*
**Art Stream with Credit pass for Hard Technology (Mathematical Technology, Electronic Electrical & Information Technology with O/L English ;** *or*
**NVQ Level 3 or 4 (Relevant Field) with O/L English & Mathematics**
අ.පො.ස. (උ.පෙළ) ගණිතය/ඉංජිනේරු තාක්ෂණවේදය සඳහා සාමාර්ථ 3ක් සමග අ.පො.ස (සා.පෙළ) ඉංග්‍රීසි
*හෝ*
අ.පො.ස. (උ.පෙළ) ගණිතය/ඉංජිනේරු තාක්ෂණවේදය සඳහා අවම වශයෙන් එක් සාමාර්ථයක් ලබා තිබීම සමග අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි (කොන්දේසි සහිත)
*හෝ*
දෘඪ තාක්‍ෂණය සඳහා C සාමාර්ථ සහිත කලා විෂයයන් (ගණිත තාක්‍ෂණය, ඉලෙක්ට්‍රොනික විද්‍යුත් සහ තොරතුරු තාක්‍ෂණය) සමග සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි
*හෝ*
NVQ 3 හෝ 4 මට්ටම් (අදාළ විෂයය ක්ෂේත්‍රය) සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි සහ ගණිතය
*හෝ*

**National Certificate in Automobile Painter**

**National Certificate in Baker**

**Quick Service Restaurant (QSR)**

**passes for G. C. E. (O/L)**
*or*
**pass grade 9**
අ.පො.ස. (සා. පෙළ) සමත්
*හෝ*
9 වසර මට්ටම

අර්ධකාලීන පාඨමාලා
පාඨමාලා සහ ඇතුලත්වීමේ සුදුසුකම් :
Course & Entry Qualification :

National Diploma in CNC Technology - NVQ V
National Diploma in Mechatronic Technology - NVQ V
National Diploma in Refrigerator & Air - condition Technology - NVQ V
National Diploma in Automobile Technology - NVQ V
National Diploma in Welding Technology

අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 හෝ 4 සමඟ වසරක පළපුරුද්දක් හෝ අදාල වෘත්තියේ වසරකට නොඅඩු පූර්ණකාලීන පාඨමාලාවක් හදාරා තිබීම හා වසර දෙකක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද

NVQ 3 or 4 in the relevant field or two years' experience in the relevant field after identifying a full time program of not less than one year in the relevant profession

National Certificate in Electrician (industry)
National Certificate in Pneumatic Technician
National Certificate in Machinist (CNC Milling &Lathe)
National Certificate in Welding
National Certificate in ICT Technician
National Certificate in Draft Person
National Certificate in Computer Application Assistant

G. C. E. (O/L) විෂයයන් හයක් සමත්වීම

06 Passes for G. C. E. (O/L)

Industrial Electronic Technician
Robotics Basic Programming

ගණිතය සහ විද්‍යාව සමග G. C. E. (O/L) විෂයයන් 06ක් සමත්වීම
06 passes for G. C. E. (O/L) with credit pass for mathematics & Science

Certificate in Pneumatics and Hydraulics- අ.පො.ස. (සා. පෙළ) සමත්වීම, Pass G.C.E. (O/L)

**Ministry of Skills Development and Vocational Training**

Sri Lanka Korea National Vocational Training Institute

**K-TEC**

**Registration of Student for the Academic Year – 2023/2024**

| **Student Personal Information** | | **Full Time** | | **Week End** | | **Evening** |
|---|---|---|---|---|---|---|

| Name with Initials: |
|---|
| Full Name in Capital Letters: |

| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | |

| Date of Birth | D | M | Y | Age on the Date of Registration: | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | Years | Months | Days |

| National ID No. | | Sex | F | | M | | Marital Status | Single | Married |
|---|---|---|---|---|---|---|---|---|---|

| Permanent Address | |
|---|---|
| | |

| Contact Numbers | Residence: | Mobile: | E-Mail: |
|---|---|---|---|

| Residential District | |
|---|---|

**Course Information**

| Name of the Preferred Course | 1.<br>2.<br>3. |
|---|---|

| Entry Level Qualification | NVQ Stream | | **G.C.E. (A/L) Stream** | |
|---|---|---|---|---|

**Education Details**

| Name of the School last attended | |
|---|---|

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| Highest Examination passed | Year 10 | | G.C.E. (O/L) | | G.C.E. (A/L) | | Other | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| G.C.E. (O/L) | | | | | | G.C.E. (A/L) | | | | | |
| Index No. | | | Year | | | Index No. | | | Year | | |
| Subject | | Result | Subject | | Result | Subject | | Result | Subject | | Result |
| 1 | | | 5 | | | 1 | | | 5 | | |
| 2 | | | 6 | | | 2 | | | 6 | | |
| 3 | | | 7 | | | 3 | | | 7 | | |
| 4 | | | 8 | | | 4 | | | 8 | | |

| | | | | |
|---|---|---|---|---|
| **Student with NVQ Level 4 Qualification** | | | | |
| Occupational Name of the Qualification/Course Name | | | Qualification Code | |
| Effective date of Qualification | | | | |
| Mode of Assessment | RPL | Yes/No | Accredited Course | Yes/No |
| If Accredited Course, Name of the Training Centre | | | | |

I, do hereby certify that the information furnished above is true and correct and conform to the entry qualifications indicated in the advertisement and that I have not registered for any full time Degree or Diploma in a University or any other Government Academic Institutions in Sri Lanka.

……………………………………………., ……………………………………………
Signature of applicant. Date

*Please paste the Bank slip here*

____________________,
සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

06-56

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛනඥ නිලධාරීන් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2024)

First Efficiency Bar Examination for Senior Statisticians/Statisticians in the Department of Census and Statistics - 2016 (2024)

01. ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/සංඛ්‍යාලේඛනඥ තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් **2024 සැප්තැම්බර් මාසයේ** දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති මෙම *ගැසට්* පත්‍රයේ මුල වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනු ඇත.

03. *විභාග ගාස්තු :*

විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙන ම වාර කීපයක දී හෝ පෙනී සිටිය හැකි ය. සම්පූර්ණ විභාගය සඳහා හෝ එක් විෂයයක් හෝ විෂයයන් කීහිපයක් සඳහා හෝ මුල්ම වතාවට අයදුම්කරන අපේක්ෂකයින්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. ඉන්පසු අයදුම්කරන ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු. 600 ක විභාග ගාස්තුවක් ද, විෂයන් දෙකක් හෝ ඊට වැඩිනම් හෝ සම්පූර්ණ විභාගය සඳහා ම නම් රු. 1,200 ක විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උපතැපැල් කාර්යාලයකට හෝ ඕනෑම දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ.

(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

04. *අයදුම්පත් :*

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. මෙම ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 04 තෙක් පළමුවන පිටුවටත්, ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළ යුතු ය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව, ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිළිව අයදුම්කරුගේ අත්අකුරින් ම සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2024 ජූලි මස 12 වැනි දිනට** පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :*

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශීය ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීමට අදාළ නම්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එහි දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු වේ නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමුකර විමසා සිටීම ප්‍රතිඵලදායී වනු ඇත.

07. විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු අතර, එය ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය. එමෙන් ම, විභාගය සඳහා පෙනී සිටි පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු වේ.

08. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ගෙන් පළමුවර විභාගයට පෙනී සිටින නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ. තමාට නියමිත විභාග ශාලාවේ දී ම විභාගයට පෙනී සිටිය යුතු අතර, තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

09. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ලෙස, රාජ්‍ය සේවයට ඇතුළත් වීම සඳහා පැවැති අදාළ තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට ඇතුළත් වූ අයදුම්කරුවකු නම්, රාජ්‍ය සේවයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

11. *විභාග පටිපාටිය* :

ඉහත තනතුරට අදාළ විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.

| *විෂයය* | *කාලය* | *ලකුණු* | *සමත් ලකුණු* ප්‍රතිශතය |
|---|---|---|---|
| 1. පරිපාලනය | පැය 02 | 100 | 40% |
| 2. රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | පැය 02 | 100 | 40% |
| 3. ඉංග්‍රීසි | පැය 02 | 100 | 40% |
| 4. ව්‍යවහාරික සංඛ්‍යානය | පැය 03 | 100 | 40% |

(01) පරිපාලනය (විෂයය අංක 01)

I කොටස - පරිපාලනය

II කොටස - කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ. VI, VII, IX, XI, XII, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII සහ XLVIII

- *ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය* :

(*a*) එක් කොටසකට ප්‍රශ්න හතර බැගින් ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. ප්‍රශ්න ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා ස්වරූපය වේ.

(*b*) I හා II කොටස්වලින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(*c*) සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

(02) රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය (විෂයය අංක 02) මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද මත සැකසේ.

I - සියලුම වගන්ති
II - සියලුම වගන්ති
III - සියලුම වගන්ති
IV - සියලුම වගන්ති
V - 1, 2, 3, 4 වගන්ති
VI - සියලුම වගන්ති
VII - 1, 2, 3, 4 සහ 6 වන වගන්ති

- ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය ඃ

(a) ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න හයකින් සමන්විත වේ. ප්‍රශ්න ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා ස්වරූපය වේ.
(b) ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.
(c) සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

(03) ඉංග්‍රීසි (විෂයය අංක 03)
**English Grammar**
A suitable level of proficiency on the following forms of grammar in spoken and written language is expected from the candidate.
- Tense and Number
- Sentences (Simple/Compound/Complex/ Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

***Writing Skills*** **:**

The knowledge on the modern formats and styles of writing is tested in this area of study.

- Internal modes of Communication
- Formal Correspondences skills
- Writing Descriptions/Explanations
- Summary writing skills
- Report Writing Skills
- Minutes of Meeting/Agendas/Invitations
- Comprehension

***Reading skills*** **:**

Candidate's ability to comprehend a printed text; infer meaning and verbal/written interpretation is expected.

* Reading and understanding the specific and general meaning of the printed text
* Reading and interpretation (Verbal/written)
* Understanding the cohesion and coherence of a passage.

- ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය ඃ

(a) ප්‍රශ්න පත්‍රයේ පහත කරුණු සම්බන්ධ ප්‍රශ්න අඩංගු වේ.
(i) ව්‍යාකරණ
(ii) අවබෝධය
(iii) වාග්මාලාව
(iv) රචනා

(b) සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතුයි.

(04) ව්‍යවහාරික සංඛ්‍යානය (විෂයය අංක 04)

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කර්මාන්ත, කෘෂිකර්ම සංඛ්‍යාති, ජාතික ගිණුම්, තොරතුරු තාක්ෂණ (දත්ත සැකසුම්), නියැදි සමීක්ෂණ, ජන සංගණන හා ප්‍රජා විද්‍යා, මිල දර්ශකාංග හා සිතියම් යන අංශ මගින් සිදුකරනු ලබන සංඛ්‍යානමය කාර්යයන් පිළිබඳව අදාළ නිලධාරීන්ගේ දැනුම ඇගයීම පිණිස සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි.

- ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය ඃ

(a) ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න අටකින් සමන්විත වේ. ප්‍රශ්න, ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා ස්වරූපය වේ.
(b) ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

11.1 එක් එක් විෂයයෙන් සාමාර්ථය ලැබීම සඳහා 40% ක් හෝ ඊට ඉහළ ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතු අතර, කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සඳහා සෑම විෂයයකින් ම සාමාර්ථය ලැබිය යුතු ය. විභාගයට නියමිත විෂයයන් එක් වරක දී හෝ කිහිපවරක දී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

12. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

13. මෙම *ගැසට් නිවේදනය* මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයට අනුව අදාළ කරුණු බලපැවැත් වේ.

අධ්‍යක්ෂ ජනරාල්.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/සංඛ්‍යාලේඛනඥ නිලධාරීන් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016(2024)***

First Efficiency Bar Examination for Senior Statisticians / Statisticians in the Department of Census and Statistics - 2016 (2024)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :————.
(*උදා* :- GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. සේවා ස්ථානය හා ලිපිනය :

2.1 සේවා ස්ථානයේ නම :————————————.

2.2 රාජකාරී ලිපිනය :————————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

03. 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 ජාතික හැඳුනුම්පත් අංකය :

3.3 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

3.4 ජංගම දුරකථන අංකය :

04. ඔබ ඉදිරිපත්වන කඩඉම් විභාගයට අදාළ විෂයය/විෂයයන් :

(*ගැසට් නිවේදනයේ 10 වන ඡේදය බලන්න.*)

| *අනු. අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |
| 04. | | |

05. දැනට දරන තනතුර :

5.1 පත්වීම් ලිපියේ අංකය :————.
5.2 පත්වීම් දිනය :————.

06. ඔබ විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට ද? :————.
6.1 විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
6.2 ලදුපත් අංකය :————.
6.3 දිනය :————.

| |
|---|
| ලදුපත මෙහි අලවන්න. (අදාළ නම් පමණි).<br>(ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, ප්‍රකාශ කරන අතර මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

*අත්සන සහතික කිරීම :*

මගේ දෙපාර්තමේන්තුවේ නිලධාරියකු / නිලධාරිනියක වන මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන......... .......................... මයා/ මිය/ මෙනෙවිය .......................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මම සහතික කරමි.

————————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————————————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂාකර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :————————————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

06-98

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2024)

### Second Efficiency Bar Examination for Grade I Statistical Officers in the Department of Census and Statistics - 2016 (2024)

01. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව සංඛ්‍යාලේඛන නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් **2024 සැප්තැම්බර් මාසයේ** දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට්* පත්‍රයේ මුල් පිටුවල වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. *විභාග ගාස්තු* :

විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම වාර දෙකක දී හෝ පෙනී සිටිය හැකි ය. සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයයකට හෝ පළමු වරට අයදුම් කරන අපේක්ෂකයන්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන්පසු පෙනී සිටින ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු. 250 ක විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය සඳහා රු. 500 විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට හෝ ඕනෑම දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. *අයදුම්පත* :

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. මෙම ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් පිළියෙළ කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙළ කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව, ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිළිව අයදුම්කරුගේ අත්අකුරින් ම සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් අයදුම්කරුවන් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **2024 ජූලි මස 12 වැනි දිනට** පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තවද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2024 ජුනි මස 17 වැනි දින සිට ආරම්භ කරනු ලබයි.

05. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශීය ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්විය යුතුය.

එහි දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළයුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු වේ නම් ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මඟින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසා සිටීම ද ප්‍රතිඵලදායී වනු ඇත.

06.1 විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වනවිට පැවති අයදුම්කරුවන්ගේ තනතුර හා සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

06.2 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය.

06.3 විභාගය සඳහා පෙනී සිටින දිනයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති, ප්‍රථම වතාවට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08.1. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍යය ලෙස, තරග විභාගයක් මඟින් රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම්, තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද, තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම්, රාජ්‍ය සේවයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද වශයෙන් තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලු ම විෂයයන් සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

08.2 විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි. විභාගයට ඉදිරිපත් වූ සියලු අයදුම්කරුවන්ගේ ලකුණු ඇතුළත් ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදුකරනු නොලැබේ. විභාගයට නියමිත විෂයයන් එක් වරක දී හෝ කිහිප වරක දී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

10. විභාග පටිපාටිය :

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත. :-

| විෂයය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| 2. මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

| | ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය |
|---|---|---|
| 1 | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | ➢ මේ සඳහා ආයතන සංග්‍රහයේ XV,XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII යන පරිච්ඡේද සහ එම පරිච්ඡේද සංශෝධනය කරන ලද චක්‍රලේඛ පිළිබඳව ද අවධානයට ගත යුතු වේ.<br><br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :*<br>(*a*) මුළු ප්‍රශ්න ගණන 06 කි. 1 වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10කින් සමන්විත වන අතර අනෙක් ප්‍රශ්න 05 අනු කොටස් 05කින් සමන්විත වේ.<br>(*b*) පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර, අනෙක් ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතුය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි. |
| 2 | මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ. :<br>(*a*) vi වන පරිච්ඡේදය, ආණ්ඩුවේ මුදල් යනාදිය භාරකාරිත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම්<br>● 1 වැනි කොටස - ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරීත්වය හා ආරක්ෂාව<br>● 2 වැනි කොටස - උප පත්‍රිකා පොත්<br>● 3 වැනි කොටස - මුදල්, මුද්දර යනාදිය පිළිබඳ සමීක්ෂණ මණ්ඩල<br>● 4 වැනි කොටස - අග්‍රිම<br>● 5 වැනි කොටස - බැංකු ගිණුම්<br>(මු.රෙ. 315 සිට 396 දක්වා සහ ඒවායේ සියලුම සංශෝධන පිළිබඳව ද අවධානයට ගත යුතුය.) |

| | ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය |
|---|---|---|
| | | (*b*) ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය 2006 - භාණ්ඩ හා වැඩ යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ඒවායේ සියලුම සංශෝධන පිළිබඳව ද අවධානයට ගත යුතුය. (XIII වන පරිච්ඡේදය - සැපයුම් වැඩ හා සේවා සැපයීම් මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණය, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පටිපාටියේ බැහැර වීම (මු. රෙ. 708 සිට 775 දක්වා)<br><br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය*<br>(*c*) මුළු ප්‍රශ්න ගණන 06කි. I වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10කින් සමන්විත වන අතර අනෙක් ප්‍රශ්න 05 අනු කොටස් 05කින් සමන්විත වේ.<br>(*d*) පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර, අනෙක් ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතුය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි. |

*සටහන* -

- ඉහත විෂයයන් ට වෙන වෙන ම පෙනී සිටිය හැකිය.
- නියමිත කාලය තුළ දී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

11. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

12. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

13. මෙම *ගැසට්* නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත් වේ.

අධ්‍යක්ෂ ජනරාල්.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2024)***

Second Efficiency Bar Examination for Grade I Statistical Officers in the Department of Census and Statistics - 2016 (2024)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා :- GUNAWARDHANA, H.M.S.K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 පෞද්ගලික ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

ස්ථාවර දුරකථන අංකය : | | | | | | | | | | |

03. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

04. ස්ත්‍රී/ පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත් වන විෂයය/විෂයයන් :

| *අනු. අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |

06. උපන් දිනය :
වර්ෂය : | | | | |
මාසය : | | |
දිනය : | | |

07. දූනට දරන
7.1 තනතුර :————.
7.2 පත්වීම් ලිපියේ අංකය :————.

08. 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.
8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
8.3 ලදුපත් අංකය :————.
8.4 දිනය :————.

| ලදුපත මෙහි අලවන්න. (අදාල නම් පමණි).<br>(ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |
|---|

09. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රුපියල් . . . . . . . ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*සටහන* .- තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

10. *අත්සන සහතික කිරීම* :

මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියකු / නිලධාරිනියක සහ පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන......... .......................... මයා/ මිය/ මෙනෙවිය .......................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

____________________,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :——————————————.
පදවි නාමය :—————.
ලිපිනය :—————.
දිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂාකර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිලමුද්‍රාව.

නම :——————————————.
පදවි නාමය :—————.
ලිපිනය :—————.
දිනය :—————.

06-99/1

---

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2024)

### First Efficiency Bar Examination for Grade II Statistical Officers in the Department of Census and Statistics - 2016 (2024)

01. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවාගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් **2024 සැප්තැම්බර් මාසයේ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටතේ වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති *ගැසට්* පත්‍රයේ මුල් පිටුවල වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. *විභාග ගාස්තු* : විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගයට හෝ ඉන් කොටසකට හෝ පළමුවරට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන්පසු පෙනී සිටින

ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු. 250/- ක විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය සඳහා රු. 500/- ක විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශිර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට හෝ ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතුය. (විභාග ගාස්තු ගෙවා ලබා ගන්නා ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. *අයදුම්පත* : අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. මෙම ආදර්ශ අයදුම්පත අනුව A 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශිර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවටත්, ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළයුතුය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුවද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින් ම සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අයදුම්කරුවන් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2024 ජූලි මස 12** වැනි දිනට පෙර ලැබෙන සේ ''විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තවද, සම්පූර්ණ කරන ලද අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත්, අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) මාර්ගගත අයදුම්පත් බාර ගැනීම 2024 ජුනි මස 17 වැනි දින සිට ආරම්භ කරනු ලබයි.

05. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ. :

I. ජාතික හැඳුනුම්පත.
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළයුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු වේ නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම ද ප්‍රතිඵලදායි වනු ඇත.

06.01 විභාගයට ඉල්ලුම් කරන අවස්ථාව වනවිට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළවන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

06.02 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවන් ප්‍රවේශ පත්‍රයේ තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා හෝ සහතික කරවා ගත යුතුය.

06.03 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති, ප්‍රථම වතාවට විභාගය සඳහා පෙනී සිටින නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබා දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08.1 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයවලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍ය ලෙස, තරඟ විභාගයක් මඟින් රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම්, තරඟ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද තරඟ විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද වශයෙන් තෝරා ගත යුතුය. විභාගයට නියමිත සියලුම විෂයයන් සඳහා එකම භාෂා මාධ්‍යකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

08.2 විභාගය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි. විභාගයට ඉදිරිපත් වූ සියලු අයදුම්කරුවන්ගේ ලකුණු ඇතුළත් ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදුකරනු නොලැබේ. විභාගයට නියමිත විෂයයන් එක් වරක දී හෝ කිහිපවරක දී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

10. විභාග පටිපාටිය.

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත. :-

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. මූලික සංඛ්‍යාන ක්‍රම | පැය 2 | 100 | 40% |
| 2. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 2 | 100 | 40% |
| 3. මුදල් රෙගුලාසි | පැය 2 | 100 | 40% |

| | *ප්‍රශ්න පත්‍රය* | *විෂයය නිර්දේශය* |
|---|---|---|
| 1 | මූලික සංඛ්‍යාන ක්‍රම | ➢ දත්ත එක්රැස් කිරීම හා ඉදිරිපත් කිරීම, t ව්‍යාප්ති, ප්‍රමථ ව්‍යාප්ති, t කල්පිත පරීක්ෂා මූලධර්ම හා $X^2$ පරීක්ෂා ජාල රේඛය හා සංඛ්‍යාත වක්‍ර කේන්ද්‍රික ප්‍රවණතාව හා අපකිරණයේ මිනුම් (මාතය, මධ්‍යස්ථය, මධ්‍යයන, විචලතාව, චතුර්ථක හා සම්මත අපගමනය) නියැදුම්වාදයේ මූලධර්ම, නියැදුම් සමීක්ෂණය, නියැදුම් දෝෂය, හා නොනියැදුම් දෝෂය, දර්ශක අංක, සරල සහසම්බන්ධතාව, රේඛීය ප්‍රතිපායනය සහ සංඛ්‍යාන විද්‍යා මූලික දැනුම<br><br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :*<br><br>(a) මුළු ප්‍රශ්න ගණන 06කි. 1 වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10කින් සමන්විත වන අතර අනෙක් ප්‍රශ්න 05 අනු කොටස් 05කින් සමන්විත වේ.<br><br>(b) පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර, අනෙක් ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතු ය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි. |

| | | |
|---|---|---|
| 2 | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | ➢ මේ සඳහා ආයතන සංග්‍රහයේ II, III, IV, V, VIII, XII, XIII, XIV, XIX යන පරිච්ඡේද සහ එම පරිච්ඡේද සංශෝධනය කරන ලද චක්‍රලේඛයන් පිළිබඳව ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳව ද අවධානයට ගත යුතු වේ.<br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :*<br>(a) මුළු ප්‍රශ්න ගණන 06කි. 1 වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10කින් සමන්විත වන අතර අනෙක් ප්‍රශ්න 05 අනු කොටස් 05කින් සමන්විත වේ.<br>(b) පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර, අනෙක් ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතු ය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි. |
| 3 | මුදල් රෙගුලාසි | මෙය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br>➢ I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු, ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම (මු. රෙ. 1 සිට 68 දක්වා)<br>➢ III වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව, ප්‍රධාන ගණක නිලධාරීන්, ගණක නිලධාරීන්, ආදායම් ගිණුම් නිලධාරීන් ගෙවීම් සඳහා බලය ලබා දීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම (මු. රෙ. 124 සිට 147 දක්වා)<br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :*<br>(a) මුළු ප්‍රශ්න ගණන 06කි. 1 වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10කින් සමන්විත වන අතර අනෙක් ප්‍රශ්න 05 අනු කොටස් 05කින් සමන්විත වේ.<br>(b) පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර, අනෙක් ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතු ය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි. |

***සටහන*** -

- ➢ ඉහත විෂයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකිය.
- ➢ නියමිත කාලය තුළ දී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

11. අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. විභාගය පැවත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13. මෙම *ගැසට්* නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවිට සිංහල නිවේදනයේ සඳහන් කරනු බලපැවැත්වේ.

අධ්‍යක්ෂ ජනරාල්.
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71,
පොල්දුව පාර,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

***ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013 (2020)***

***First Efficiency Bar Examination for Grade II Statistical Officers in the Department of Census and Statistics 2016 (2024)***

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා :- GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 පෞද්ගලික ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 ජංගම දුරකථන අංකය

ස්ථාවර දුරකථන අංකය

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. ස්ත්‍රී/ පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත්වන විෂයය/විෂයයන් :

| *අනු. අංකය* | *විෂය* | *විෂය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |

06. උපන් දිනය :

| වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

07. දැනට දරන ඃ
 7.1 තනතුර :————.
 7.2 පත්වීම් ලිපියේ අංකය :————.

08. 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.

 8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.

 8.3 ලදුපත් අංකය :————.

 8.4 දිනය :————.

ලදුපත මෙහි අලවන්න. (අදාළ නම් පමණි).
(ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

09. *අයදුම්කරුගේ ප්‍රකාශය* ඃ

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රුපියල් .............. ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

*සටහන* - තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

10. *අත්සන සහතික කිරීම* ඃ

මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියකු / නිලධාරිනියක සහ පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන......... .......................... මයා/ මිය/ මෙනෙවිය .......................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත්, ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————.

පදවි නාමය :————.

ලිපිනය :————.

දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂාකර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිලමුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

06 - 99/2

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

බටහිර සංගීත ලිඛිත විභාගය - 2024

I වන ශ්‍රේණිය සිට VIII වන ශ්‍රේණිය දක්වා සහ ඩිප්ලෝමා

ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ඉහත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. **2024 ජුනි මස 14 වැනි දින** සිට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් (www.doenets.lk), අයදුම්පත් ලබාගත හැකි අතර තැපෑලෙන් හා පැමිණ ඉල්ලූ විට ද නිකුත් කරනු ලැබේ.

අයදුම්පත් තැපෑලෙන් ලබාගන්නා අයදුම්කරුවන් නම සහ ලිපිනය ලියූ රුපියල් 50.00 ක වටිනාකමකින් යුත් වලංගු මුද්දර ඇලවූ 9"x4" ප්‍රමාණයේ ලියුම් කවරයක් සමඟ පහත සඳහන් ලිපිනයට **2024 ජුනි මස 28 වන දිනට** පෙර අයදුම් කළ යුතු ය.

ලිපිනය : විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ.

කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම "බටහිර සංගීත ලිඛිත විභාගය - 2024" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

පැමිණ අයදුම්පත් ලබාගන්නා අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විමසීම් කවුන්ටරයෙන් මෙම අයදුම්පත් **2024 ජුලි මස 10** වැනි දින දක්වා ලබාගත හැකි අතර, සම්පූර්ණ කරන ලද අයදුම්පත් තැපැල් මඟින් පමණක් එවිය යුතු ය.

අයදුම්පත් භාරගන්නා අවසාන දින **2024 ජුලි මස 12** වන දින වේ.

දුරකථන : 011 - 2785230/ 011 - 2177075
ෆැක්ස් : 011 - 2784232

එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර.
විභාග කොමසාරිස් ජනරාල්.

ආයතනික විභාග සංවිධාන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

06 - 105

### අධ්‍යාපන අමාත්‍යාංශය

### දිවයිනේ වතු ආශ්‍රිත දෙමළ මාධ්‍ය පාසල්වලට පාසල් පාදකව ගුරු සහායකයින් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024

දිවයිනේ වතු ආශ්‍රිත දෙමළ මාධ්‍ය පාසල්වලට පාසල් පාදකව ගුරු සහායකයින් බඳවා ගැනීමට සුදුසුකම්ලත් ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශවයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications -Recruitment Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. අයදුම්පත් භාරගැනීම **2024.06.14 දින පෙ.ව 09.00 ට ආරම්භ වී 2024.07.12 දින ප.ව 09.00 ට** අවසන් වේ. මෙම විභාගය **2024 අගෝස්තු මස** පවත්වනු ලැබේ.

**02. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :**

2.1 මේ සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් මෙම *ගැසට්* නිවේදනයේ 10.1 වගන්තිය පරිදි ලිඛිත තරග විභාගයක් පවත්වනු ලැබේ.

2.2 ලිඛිත තරග විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් වූ අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතා අනුපිළිවෙළට අදාළ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයකට (03) සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම *ගැසට්* නිවේදනයේ 10.2 වගන්තිය පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයින්ගේ නාමලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.(සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

2.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී මූලික සුදුසුකම් සපුරනු ලැබූ අයදුම්කරුවන් මෙම *ගැසට්* නිවේදනයේ 10.3 වගන්තිය අනුව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත සෘජුව යොමු කරනු ලැබේ.

2.4 ප්‍රායෝගික පරීක්ෂණයේ දී හා ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ හා ඉල්ලුම් කර ඇති විෂය අනුව පාසල් පාදකව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

2.5 මෙම *ගැසට්* නිවේදනයට අදාළ පත්වීම් විෂයන් හි පුරප්පාඩු උපලේඛනය 04හි සඳහන් වේ. උපලේඛනයේ සඳහන් පුරප්පාඩු සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

**සටහන 1 ;**

එකම පාසලට මනාපය පළකර ඇති අයදුම්කරුවන් කිහිප දෙනකු සමාන ලකුණු ලබා තිබෙන අවස්ථාවක දී පාසල් සඳහා ස්ථාන ගත කිරීම සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

2.6 මෙම බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ පාසල් පාදක පුරප්පාඩු පදනම්කර ගනිමින් වන බැවින් වසර දහයක් (10) ක් ගත වනතුරු කිසිදු අයුරකින් ස්ථාන මාරුවීම් ලබා දෙනු නොලැබේ.

03. ***සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි*** :

3.1 අදාළ ලිඛිත විභාගයේ ලකුණු හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාව පදනම් කරගෙන වතු පාසල් සඳහා ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන් පුරප්පාඩු පවතින රජයේ පාසල්වලට වසර 05 ක කාල සීමාවක් සඳහා ගුරු සහායක ලෙස බඳවා ගනු ලැබේ.

3.2 මෙසේ බඳවා ගනු ලබන ගුරු සහායකයින් ස්වකීය පළමු පත්වීම් දිනයේ සිට වසර 05ක් ඇතුළත තමන් පත්කළ විෂයට අදාළව ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 13.9 අනුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන ගුරු පුහුණුවක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් අදාළ විෂයට උපාධියක් ලබාගත යුතු අතර එම ගුරු පුහුණුව හෝ උපාධිය වලංගුවන දින සිට ඔහු/ඇය ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (අ) හෝ 3-1(ආ) ශ්‍රේණියට ස්ථිර පත්වීම් ලබා දෙනු ලැබේ.

3.3 නියමිත වසර පහක (5) කාලය ඇතුළත ඉහත (3.2) හි සඳහන් සුදුසුකම් සපුරා ගැනීමට අපොහොසත්වන ගුරු සහායකවරුන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

3.4 පත්වීම ලබාදීමේදී වතු ආශ්‍රිත පාසල පිහිටි කලාපය තුළ පදිංචි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාව ලබාදෙනු ඇත.

3.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත්වේ.

3.6 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ට ද එම සේවා ව්‍යවස්ථාවට මින් මතුවට සිදුකරනු ලබන සංශෝධනයන්ට ද රාජ්‍ය සේවයේ පත්වීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වනු ඇත.

**04. වැටුප් පරිමාණය :**

ගුරු සහායකයන් ලෙස තෝරා ගන්නා අයදුම්කරුවන් සඳහා සියලු දීමනා ඇතුළත්ව මසකට රු.20,000.00 ක දීමනාවක් ගෙවනු ලැබේ.

**05. *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* :**

5.1 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2024.06.14 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

5.2 අධ්‍යාපන අමාත්‍යාංශය පිළිගත් ප්‍රතිපත්තිය මත අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උසස් පෙළ) විභාගය පහත සඳහන් පරිදි සමත් විය යුතුය.

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය අනුයාත වසර 2ක් තුළ දී, දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉල්ලුම් කරන විෂයට සම්මාන සාමාර්ථයක් ඇතුළත් ව සම්මාන 3ක් සහිත ව මව්බස හා ගණිතය ද ඇතුළත් ව විෂයයන් 6කින් එක්වර සමත්වීම.

අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් එක් වරක දී විෂයන් 03 ම සමත් වීම.

**සටහන 2 :**

ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව සෑම අයදුම්කරුවකු ම අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයක් වශයෙන් සමත් වී තිබිය යුතුය. විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස. (සා.පෙළ) විභාගය හා සමාන ව පිළිගනු ලබන වෙනත් විභාග සමතුන්ට ද මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

**5.1.4.** *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

(ඒ අනුව 2006.06.14 දිනට හෝ ඊට පෙර හා 1989.06.14 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

**5.1.5.** *අනෙකුත් අවශ්‍යතා* :

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. අයදුම්කරුවන් විසින් වතු ආශ්‍රිත ප්‍රදේශයක (උපලේඛන 03 හි සඳහන් අධ්‍යාපන කලාප පිහිටි ප්‍රදේශයක) ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.
(ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද ඡන්ද හිමි නාමලේඛනයේ පිටපත සහ මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කළ යුතුය.)

v. සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙ හි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

vi. මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමග ''විභාග කොමසාරිස් ජනරාල් ආයතනික විභාග සංවිධාන ශාඛාව , ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල'' යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

**06.** *අයදුම් කිරීමේ ක්‍රමය :*

6.1 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. මාර්ගගතව ඉදිරිපත් කළ අයදුම්පත් සංශෝධනය කිරීමට අවශ්‍ය වන්නේ නම් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඒ සඳහා අවස්ථාව සලසා ඇත. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.2 විභාග පරිපාටිය :

6.2.1 මෙම විභාගය දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ.

6.2.2 මෙම බඳවා ගැනීම් නිවේදනයේ අවසානයේ සඳහන් වන උපලේඛන 03 හි දක්වා ඇති දිස්ත්‍රික්කවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් විභාගය පැවැත්වේ.අයදුම්කරු විසින් ඉල්ලුම් කරනු ලබන දිස්ත්‍රික්ක උපලේඛන 03 අනුවම විය යුතු අතර ඉල්ලුම් කරන ලද දිස්ත්‍රික්කය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහි ම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

6.2.3 සෑම අයදුම්කරුවකු ම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ දෙමළ භාෂා මාධ්‍යයෙන් පමණි.

6.2.4 විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වේ. සෑම අයදුම්කරුවකු ම ප්‍රශ්න පත්‍ර දෙකටම (02) පෙනී සිටිය යුතුය. සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40%ක් ලබා ගැනීම අනිවාර්ය වේ.

6.2.5 එක් වරක දී බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

6.3 එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

6.4 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත මාර්ගගතව යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර, අයදුම්කරුවන් වෙත කෙටි පණිවිඩයක් මගින් දැනුම් දෙනු ලැබේ. ප්‍රවේශපත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා අයදුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශපත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට ෆැක්ස් අංකයක් ද සඳහන් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ මුද්‍රිත පිටපත සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

07. ***විභාගයට පෙනී සිටීම*** :

7.1 අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. විභාග කොමසාරිස් ජනරාල් වෙතින් ලබාගත් ලිඛිත අවසරයකින් තොරව විභාග ශාලාව වෙනස් කරන අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල අත්හිටවනු ලැබේ. සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

සටහන 3 :

අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් දැරීමට සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස සලකනු නොලබන අතර විභාගය සමත්වීම ම පත්වීම් ලැබීමට සුදුසුකමක් ලෙස සලකනු නොලැබේ.

**08. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :**

8.1 විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

8.2 එමෙන් ම විභාග අපේක්ෂකයින් තම අනන්‍යතාව තහවුරු කර ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**09. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :**

අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**10. විෂය නිර්දේශය :**

10.1 ලිඛිත විභාගය :-

මෙම විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව දෙකකි. සුදුසුකම් ලැබීම සඳහා ප්‍රශ්න පත්‍ර දෙක සඳහා ම පෙනී සිටීම අනිවාර්යය වේ.

(i). අභියෝග්‍යතාව - කාලය පැය එක යි. (01) (ලකුණු 100 යි)

සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහ සහ අන්තර් සම්බන්ධතාවලට අදාළ ව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව, ප්‍රමාණකරණය, කාලය හා අවකාශ අතර සම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂකයා සතු කුසලතාව මිනුම් කිරීම අපේක්ෂා කෙරේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න පනහකින් (50) යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(ii). සාමාන්‍ය දැනීම - කාලය පැය එක (01) යි. (ලකුණු 100 යි)

ගුරු ක්ෂේත්‍රයට අදාළ ව එම ක්ෂේත්‍රය පිළිබඳ ඇති සාමාන්‍ය දැනුම හා/හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන, තාක්ෂණික, ගුරු අධ්‍යාපනය ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් 2010 වර්ෂයෙන් පසුව සිදු කරන ලද දේශීය අධ්‍යාපන නවීකරණ පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න පනහකින් (50) සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

10.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

**සටහන 4 :**
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

10.3 ප්‍රායෝගික පරීක්ෂණය :-

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. ඒ සඳහා මිනිත්තු පහකට (05) නොඅඩු කාලයක් ලබාදෙනු ලැබේ. මේ සඳහා පහත පරිදි ලකුණු හිමිවේ.

| අනු. අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ට වීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

**සටහන 5 :**

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :

ගුරු වෘත්තියේ දී වැදගත්වන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාව මැන බැලීම.

10.3.1 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය :

(i) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා මිනිත්තු පහකට (05) නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.
(ii) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහකි. (25)
(iii) ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායකය සඳහා අවම වශයෙන් ලකුණු දෙක (02) බැගින් ලබා ගත යුතුය.
(iv) ප්‍රායෝගික පරීක්ෂණය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

10.3.2 නිර්ණායකයන් හි අරමුණු :

(i) *අරමුණ හා ප්‍රවිශ්ට වීම*
සාර්ථකව පාඩමෙහි අරමුණු පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.

(ii) *පෞරුෂය හා හඬ පාලනය*
ගුරුවරයකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමට ඇති හැකියාව ඇගයීම.

(iii) *සන්නිවේදනයේ පැහැදිලි බව*
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

(iv) *කාලය කළමනාකරණය*
ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාව ඇගයීම.

(v) *ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය*
අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිත කිරීමේ හැකියාව ඇගයීම.

11. **විභාග ගාස්තු :**

11.1 විභාග ගාස්තුව රු. 600.00 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

I. ඕනෑම බැංකුවක ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
II. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සක්‍රීය කර ඇති බැංකු හර කාඩ්පතක් මගින් (Through any bank debit card with internet transaction facilities)
III. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින් (Bank of Ceylon Online Banking Method)
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payments)

**සටහන 6 :**

ඉහත ක්‍රම මගින් ගෙවීම සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

11.2 ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

11.3 විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ සිදු කරනු නොලැබේ.

12. **විභාග ප්‍රතිඵල :**

12.1 ලිඛිත විභාගයට පෙනී සිට විභාගය සමත් අයදුම්කරුවන්ගේ ලිඛිත විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ මුළු ලකුණුවල ප්‍රමුඛතාව අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් වන සේ අවසන් ප්‍රතිඵල ලේඛනය සකස් කරනු ලැබේ. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

13. **අයදුම්පත පිරවීම සඳහා උපදෙස් :**

පහත උපලේඛන (01, 02, 03 හා 04) භාවිතකර මාර්ගගත අයදුම්පත සකසා තිබේ.

**උපලේඛනය 01**

| භාෂා මාධ්‍යය | කේත අංකය |
|---|---|
| දෙමළ මාධ්‍යය | 03 |

**උපලේඛනය 02**

| පළාත | කේත අංකය |
|---|---|
| බස්නාහිර පළාත | 01 |
| මධ්‍යම පළාත | 02 |
| දකුණු පළාත | 03 |
| වයඹ පළාත | 04 |
| ඌව පළාත | 05 |
| සබරගමුව පළාත | 06 |

**උපලේඛනය 03**

| පදිංචි දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් අංකය | පදිංචි කලාපය |
|---|---|---|
| කොළඹ | 01 | හෝමාගම |
| කළුතර | 02 | හොරණ |
| | | මතුගම |
| | | කළුතර |
| මහනුවර | 03 | මහනුවර |
| | | ගම්පොල |
| | | වත්තේගම |
| | | තෙල්දෙණිය |
| | | කටුගස්තොට |
| | | දෙනුවර |

| පදිංචි දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් අංකය | පදිංචි කලාපය |
|---|---|---|
| මාතලේ | 04 | මාතලේ |
| | | නාඋල |
| නුවරඑළිය | 05 | නුවරඑළිය |
| | | කොත්මලේ |
| | | හැටන් |
| | | වලපනේ |
| | | හඟුරන්කෙත |
| බදුල්ල | 06 | බදුල්ල |
| | | බණ්ඩාරවෙල |
| | | වැලිමඩ |
| | | පස්සර |
| | | වියලුව |
| මොනරාගල | 07 | මොනරාගල |
| | | බිබිල |
| ගාල්ල | 08 | ඇල්පිටිය |
| | | උඩුගම |
| මාතර | 09 | අකුරැස්ස |
| | | දෙනියාය |
| කුරුණෑගල | 10 | කුරුණෑගල |
| රත්නපුර | 11 | රත්නපුර |
| | | නිවිතිගල |
| | | බලංගොඩ |
| | | ඇඹිලිපිටිය |
| කෑගල්ල | 12 | කෑගල්ල |
| | | දෙහිඕවිට |
| | | මාවනැල්ල |

**උපලේඛන අංක 04**

පළාත් පුරප්පාඩු (දෙමළ මාධ්‍ය)

| *අනු. අංකය* | *විෂය* | *බස්නාහිර* | *වයඹ* | *මධ්‍යම* | *සබරගමුව* | *ඌව* | *දකුණ* |
|---|---|---|---|---|---|---|---|
| 01. | ප්‍රාථමික | 50 | 06 | 331 | 131 | 78 | 13 |
| 02. | ප්‍රාථමික (ඉංග්‍රීසි මාධ්‍ය) | 29 | - | 167 | 57 | 09 | - |
| 03. | විශේෂ අධ්‍යාපනය | - | - | - | 01 | - | - |
| 04. | ප්‍රාථමික සෞන්දර්යය | - | - | - | 08 | - | - |
| 05. | විද්‍යාව | 12 | 02 | 60 | 33 | 21 | 06 |
| 06. | ගණිතය | 10 | 02 | 96 | 39 | 35 | 09 |
| 07. | දෙමළ | 02 | - | 55 | 14 | 09 | 07 |
| 08. | ඉංග්‍රීසි | 05 | - | 75 | 40 | 42 | 05 |

| අනු. අංකය | විෂය | බස්නාහිර | වයඹ | මධ්‍යම | සබරගමුව | ඌව | දකුණ |
|---|---|---|---|---|---|---|---|
| 09. | ඉතිහාසය | 02 | 05 | 60 | 19 | 21 | 05 |
| 10. | ඉස්ලාම් | - | - | - | 03 | 04 | - |
| 11. | රෝමානු කතෝලික | 01 | - | 17 | 01 | - | 02 |
| 12. | ක්‍රිස්තියානි ධර්මය | - | - | 8 | 03 | - | 03 |
| 13. | භූගෝලය | 09 | - | 50 | 45 | 31 | 02 |
| 14. | පුරවැසි අධ්‍යාපනය | 02 | - | 50 | 41 | 21 | 04 |
| 15. | ව්‍යාපාර හා ගිණුම්කරණය | 03 | - | - | 19 | 21 | - |
| 16. | ව්‍යවසායකත්ව අධ්‍යයනය | - | - | - | 01 | - | - |
| 17. | දෙවනබස සිංහල | 2 | - | 90 | 06 | 32 | 02 |
| 18. | කර්ණාටක සංගීතය | 01 | - | 25 | 36 | 02 | 02 |
| 19. | චිත්‍ර | 03 | 01 | - | 36 | 22 | 05 |
| 20. | නැටුම් (භරත) | 03 | - | 25 | 35 | 28 | 02 |
| 21. | නාට්‍ය හා රංගකලාව (දෙමළ) | - | - | - | 05 | - | 04 |
| 22. | සාහිත්‍ය රසාස්වාදය (දෙමළ) | - | - | - | 10 | 10 | - |
| 23. | සාහිත්‍ය රසාස්වාදය (ආරාබි) | - | - | - | 02 | - | - |
| 24. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 02 | - | - | 47 | 49 | 05 |
| 25. | කෘෂි හා ආහාර තාක්ෂණය | 04 | - | - | 15 | 15 | 01 |
| 26. | ශිල්ප කලා | - | - | - | 01 | - | - |
| 27. | ගෘහ ආර්ථික විද්‍යාව | 08 | - | - | 14 | 15 | - |
| 28. | ප්‍රායෝගික තාක්ෂණ කුසලතා | 03 | - | - | 05 | 06 | - |
| 29. | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 08 | 03 | - | 40 | 12 | 6 |
| 30. | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | 02 | - | - | 01 | - | - |
| 31. | හින්දු ධර්මය | 04 | - | 65 | 12 | 16 | 05 |
| | **එකතුව** | **165** | **19** | **1174** | **720** | **499** | **88** |

14. අයදුම්පත් මාර්ගතව පමණක් භාර ගනු ලැබේ.

15. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේ දී සහභාගි නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බැලීමක් සිදු කරනු නොලැබේ.

16. එමෙන් ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් භාරගනු නොලැබේ.

17. ඔබ අයදුම්පතෙ හි සඳහන් කරනු ලබන කිසිදු කරුණක් පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.

18. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු වන අතර කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවකින් කොටසක් හෝ මුළුමනින් ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු වේ.

19. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

ජේ. එම්. තිලකා ජයසුන්දර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2024 ජුනි මස 12 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය,
බත්තරමුල්ල.

06-143

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.